# නුවර කන්ද විහාරයේ ඓතිහාසිකත්වය පිළිබඳ පුරාවිද්‍යාත්මක අධ්‍යයනයක්

කේ.එස්.එන්.කේ.කරුණාදාස[1]

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ වාරියපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත්ව නෑටිය ග්‍රාමනිලධාරි වසමේ නුවර කන්ද ඓතිහාසික විහාරස්ථානය පිහිටා තිබේ. මෙම විහාරස්ථානයේ ආංශුක පිහිටීම ගත් විට උතුරින්-අමර උදාගම දකුණින් - අමුණුගම නැගෙනහිරින්- දැදුරු ඔය බටහිරින්-නෑටිය ග්‍රාමය ස්වාභාවිකව පිහිටා ඇති ගල්ලෙන් සහිතව නිමවී ඇති අතර එය උස් බිමක පිහිටා තිබේ. ප්‍රොටෝ ඓතිහාසික යුගයට අයත් කටාරම් සහිත ලෙන් දැකිය හැකිය. ප්‍රධාන වශයෙන් ලෙන් 6ක් හදුනාගත හැකි අතර ඉන් වඩාත් වැදගත් ලෙන් 03ක් පවතී. ඒවා ප්‍රාග් බ්‍රාහ්මීය අක්ෂර සහිත ලෙන් ලෙස හදුනාගනී. මීට අමතරව ශිලා ඇඳන් 03ක් දැකිය හැකි අතර ශිලාමය ජත්‍රපත් හා හර්ණිකාවක කොටස් ඉතිරිව තිබේ. ඓතිහාසික වශයෙන් වැදගත්වන බිතුසිතුවම් ලෙන හා ලංකාවේ එකම දහයියා බුදුපිළිම සහිත ලෙන පුරාවිද්‍යාත්මක වශයෙන් වැදගත් වේ.

මෙම පර්යේෂයේ මූලික පරමාර්ථ කිහිපයකි. එනම්, නුවර කන්ද විහාරයේ ඓතිහාසිකත්වය සොයා බැලීම, පැරණි මානව විද්‍යාත්මක හා පුරාවිද්‍යාත්මක සාධක විමර්ශනය, බිතුසිතුවම් ලෙන හා දහයියා බුදුපිළිම ලෙනේ හායන කාරක හඳුනාග නිමින් සංරක්ෂණයට අවදානය යොමු කිරිම යනුවෙනි. නමුත් මෙහිදී අධ්‍යයන සීමා කිහිපයක් පවතී. එනම්, තොරතුරු ලබා ගැනීමේ අපහසුතාවය, ජනප්‍රවාද නිසා පුරාවිද්‍යා හා ඓතිහාසිකත්වය යටපත්වී තිබීම, බලපෑම නිසා දත්ත විනාශ වී තිබීම හා සත්ව ක්‍රියාවල බලපෑම, අනපේක්ෂිත ඉදිකිරීම් ආදියයි. මීට පෙර මේ ක්ෂේත්‍රය පිළිබඳව 2009-2010 වසර වල දී පමණ සංරක්ෂණ කටයුතු සිදුකර ඇත.එමෙන්ම 2010 වසරේ දී දොරවල් හා උළු නැවත පිළිසකර කර ඇත.නමුත් මේ පිළිබඳ විධිමත් සංරක්‍ෂණයක් සිදුවී නොමැත.

මා මෙම ක්ෂේත්‍රය අධ්‍යයනයට අපේක්‍ෂා කරන මූලික ක්‍රමවේද ලෙස, නුවර කන්ද පිළිබඳ ලියවී ඇති ග්‍රන්ථ වාර්තා පරික්ෂණය, පූර්ව පර්යේෂණ වාර්තා අධ්‍යනය, භෞතික ලෙස පර්යේෂණයට ලක්කිරීම, මානවවංශ දත්ත ලබා ගැනීම, හායන කාරක හදුනාගනිමින් සංරක්ෂණය කළ යුතු ස්ථාන හඳුනාගැනීම ආදිය වේ. දැනට පර්යේෂණය තුළින් ලබා ඇති මූලික ප්‍රගතීන් කිහිපයකි.එනම්, ඓතිහාසිකත්වය සොයා බැලීම, මානවවංශ දත්ත ලබාගැනීම, සිතුවම් ලෙන් හා දහයියා බුදු පිළිම ලෙනේ හායන කාරක හඳුනා ගැනීම, හායන කාරක හඳුනාගැනීම යනුවෙනි.

හිරියාල ප්‍රදේශයේ නුවර කන්ද විහාරය මෙරට මුල් ඓතිහාසික යුගය දක්වා දිව යන මානව සාධක සහිත මෙන්ම බොහෝ ඓතිහාසික සිදුවීම් සමග බැඳී පවතින සන්ධිස්ථානයක් වන බැවින් එය පරික්ෂාවට මෙන්ම ඒවා සුරක්ෂිත කිරීමට කටයුතු කළ යුතු බව උක්ත කරුණු තුළින් පැහැදිලි වේ.

**ප්‍රමුඛ පදඃ** නුවර කන්ද, හායන කාරක, බිතුසිතුවම්, දහයියා බුදුපිළිමය, ලෙන්

1 පුරාවිද්‍යා අධ්‍යයන අංශය, දෙවන වසර (විශේෂවේදී), පේරාදෙණිය විශ්වවිද්‍යාලය